## P 24 ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ ගැටළු විසඳීම සඳහා ප්‍රජා සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශය යොදා ගැනීමේ වැදගත්කම (මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

චම්පිකා ඩී. කේ.,ගුණවර්ධන ඒ. ඩී.

ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමට සුවිශේෂී දායකත්වයක් ලබාදෙන කෘෂිකාර්මික අංශය ආශ්‍රිතව ගැටළු රාශියක් පවතින අතර ඒ සඳහා ලැබීඇති විසඳුම් සාර්ථක නොවීම තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑමක් එල්ලවිය හැකිය. එම කෘෂිකාර්මික ගැටළු හඳුනාගෙන සාර්ථක විසඳුම් ලබාදීම කඩිනමින් සිදුකළ යුතු අතර ඒ සඳහා ප්‍රජා සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශ ක්‍රමවේදය (PRA) යොදාගැනීමේ වැදගත්කම මෙහිදී අධ්‍යයනය කරන ලදි. පර්යේෂණය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවේශය යටතේ ප්‍රාථමික සහ ද්විතීයික දත්ත භාවිත කළ අතර මුලටියන හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල PRA ක්‍රමවේදය භාවිතයෙන් කෘෂි ගැටළු සඳහා විසඳුම් ලබාදුන් වැඩසටහන් ද්විත්වයක්වන කෘෂි බිම් වලට ගංවතුරින් සිදුවන හානිය අවම කිරීම සඳහා පැතිබැම් ඉදිකිරීම හා වගාවන් ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙලක් ලෙස එම ප්‍රදේශයේ සෑම ගොවි බිමකම වී වගා කිරීමේ සෑම පියවරක්ම එකම කාලයකදී ආරම්භ කිරීමේ වැඩටහක් පවත්වාගෙනයාම සහ ඊට අමතරව මෙම කොට්ඨාසය තුළම වෙනත් ප්‍රදේශයක PRA ක්‍රමවේදය භාවිතා කරීමකින් තොරව ගොවි බිම් ගංවතුරින් ආරක්ෂා කිරීම සඳහා ඇළමාර්ග පිළිසකර කිරීම හා වගා ආරක්ෂාව සඳහා කෘමිනාශක ඉසින ටැංකි බෙදාදීමේ වැඩසටහනක් පිළිබඳව සිද්ධි අධ්‍යයනය කළ අතර ලද තොරතුරු හා දත්ත විස්තරාත්මක විශ්ලේෂණය හා කේන්ද්‍රීය ප්‍රවනතා මිණුම් භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදි. මෙහිදී ලැබුණු ප්‍රතිඵල මත ගොවීන්ගේ අවශ්‍යතා අනුව ප්‍රමුඛ ගැටළුවට විසඳුම් ලැබීම, එමගින් අතීතයට සාපේක්ෂව අස්වනු හානිය විශාල ලෙස අවමවීම, සාමාන්‍යයෙන් වී වැපිරීම හා අස්වනු ලබාගැනීම අතර අනුපාතය කුරුණි 1:30 සිට 1:38 දක්වා වැඩිවී තිබීම, ගොවීන්ගේ සාමාන්‍ය ආදායම 26%කින් පමණ ඉහළයාම යනාදී සාධක මත PRA ක්‍රමවේදය භාවිතා කරමින් කෘෂිකාර්මික ගැටළු සඳහා ලබාදුන් විසඳුම් කෘෂි ආර්ථිකය හා ගොවි ජනතාවගේ ජීවන තත්වය පැවති මට්ටමින් ඉහළට ගැන.මට හේතුවූ බව පැහැදිළි විය. PRA භාවිතා කිර.මකින් තොරව ලබාදෙනලද විසඳුම් කෘෂි ආර්ථිකය හා ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළට ගැන.මට හේතු වි නොමැති සහ එම ගැටළු ත.ව්‍රර කිරීමටද හේතු වී ඇති බව හඳුනාගත හැකිවිය. ඒ අනුව මෙම පර්යේෂණය මගින් ලැබූ නිගමන මත ග්‍රාමීය කෘෂිකාර්මික ගැටළු විසදීමේදී PRA භාවිතා කිර.ම වඩාත් යෝග්‍ය බවත් එය ගැටළු විසදීම සඳහා තිරසාර විසඳුම් ලැබීමට බොහෝසෙයින් ඉවහල් වන අතර එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය සුරක්ෂිත කිර.මේ හැකියාවද ලැබේ.

**ප්‍රමුඛපද**: ශ්‍රී ලංකා ආර්ථිකය, ග්‍රාමීය කෘෂිකාර්මික ගැටළු, ප්‍රජා සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශය, ගොවි ජනතාව